

# ගෞරවණීය මහත්මයණි, මහත්මියනි.

නිදහස් අධ්‍යාපනයේ පිහිටෙන් මව් බිමෙත් විදේශයන්ගෙත් අපි දස්කම් පෑවෙමු. නමුත් ලෝක බැංකු නිර්දේශ මත ක්‍රියාත්මක වූ 1982 අධ්‍යාපන ධවල පත්‍රිකාව තුළින් අප ලද එම දායාදය අපෙන් ගිලිහෙමින් පවතියි. අද ජාතික පාසල් වල දරුවන් හා ජාත්‍යන්තර පාසල් වල දරුවන්ට පමණක් එම අයිතිය උරුම වෙමින් පවතියි. අධ්‍යාපන ධවල පත්‍රිකාවේ නිර්මාතෘ වර්තමාන ජනාධිපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මහතා යි.

2002 මහ මැතිවරණයෙන් රනිල් වික්‍රමසිංහ මහතා රටේ අගමැතිවරයා විය. ඔහුගේ එක් අවුරුදු කාල සීමාව තුළ ක්‍රියාත්මක වූ යළි පුබුදමු ශ්‍රී ලංකා වැඩ සටහනින් අපගේ මව් බිමේ සමස්ථ ධනයම (සීගිරිය ද ඇතුළුව) විදේශයන්ට විකිණීමට හෝ බදු දීමට මං මාවත් විවර කරන ලදී.

ඒ යටතේ රටට ඇතුල් වූ අන්‍යාගමික මිෂනාරිවරුන් රටේ ආගමික අසහනය උත්සන්න කරන ලදී. එහි ඵලයන් ලෙස රටට උරුම වූයේ භික්ෂූන් වහන්සේලා ද දේශපාලනයට එක් වීමත් අන්‍යාගමික පනත් වැනි සමාජ අසහනය වපුරන පනත් නිර්මාණය වීමත් පමණි.

එසේම සටන් විරාම ගිවිසුමක් නිර්මාණය විය. එහි අවසන් තේරුම වූයේ ෆෙඩරල් බලය බෙදීමක් නොව ශ්‍රී ලංකා හමුදාවේ දෑත් දෙපා බැඳ හමුදා ඔත්තු කරුවන් ඇතුළු දෙමල සිංහල මුස්ලිම් වැසියන් එල්ටීටීඊ තුවක්කු කරුවන්ට යටත් වීම පමණි. එසේම මෙම කාලයේ අපගේ විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ද අපට අහිමි විය.

ඉතින් ලාංකිකයනි ඉතිහාසයේ පළමු වතාවට අවංක දේශාභිමානීන් එක් කඳවුරකටත් කුප්‍රකට ධනකුවේරයන් හා පරගැත්තන් අනෙක් කඳවුරටත් එකතු වී ඇත.

මහින්ද රාජපක්ෂ ට සහයෝගය දෙන්නට දේශපාලන පක්ෂ හා සංවිධාන 42 ක් එක් වී ඇත. මේ සන්ධානයට ආනන්ද සංගරී, එල්ටීටීඊ කරුණා පිළ, කම්කරු කොන්ග්‍රසයේ සතාසිවම් හා අශ්රොෆ් මැතිණිය හා අතාවුල්ලා ද ඇතුළත් ය.

මහින්ද හා ජවිපෙ කිසිම දිනෙක ජාතිවාදය ආගම්වාදය අවස්ථාවාදය කුලවාදය වෙනුවෙන් පෙනී සිට නැත. දේශීය ආර්ථිකයක් තුළින් දෙමල සිංහල මුස්ලිම් සියල්ලන්ටම තම ආර්ථික අනන්‍යතාව සුරකිමින්, කිසිම ජාතියකට තවත් ජාතියක් හා ආගමක් පෑගීමට ඉඩ නොදෙමින්, ඒකීය ශ්‍රී ලංකාවක් ගොඩනගන්නට මෙම තීරණාත්මක හෝරාවේ ඔබේ සහය මහින්ද රාජපක්ෂ ට දෙන්න. ශ්‍රී ලංකාවේ සිටින ඔබේ නෑ හිතවතුන් මේ සඳහා යොමු කරන්න.

**ඕස්ටේලියා ශ්‍රී ලංකා සුව සහන ව්‍යාපෘතිය**
**ඕස්ට්‍රේලියා ශ්‍රී ලංකා කලා පදනම**
**ශ්‍රී ලංකා මිතුරෝ**